සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

33 | S | I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ සස් පෙළ) විභාගය – දෙවන වාර පරීක්ෂණය – 2019 මාර්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - இரண்டாம் தவணைப் பரீட்சை - 2019 மார்ச்
General Certificate of Education (Adv. Level) - Second Term Test - March 2019

12 ශ්‍රේණිය
Grade 12

ගිණුම්කරණය – I
Accounting - I

පැය 01 මි. 45
One hour & 45 min

උපදෙස් :
- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **ප්‍රශ්න අංක 01 සිට 25 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**
- **ප්‍රශ්න අංක 26 සිට 40 තෙක් ප්‍රශ්නවලට කෙටි හා නිශ්චිත පිළිතුරු අදාල තිත් ඉර මත ලියන්න.**
- **සෑම ප්‍රශ්නයකටම ලකුණු 02 බැගින් හිමිවේ.**

(01) මූල්‍ය ගිණුම්කරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් නිවරදි ප්‍රකාශනය වන්නේ,

1. මූල්‍යමය ස්වරූපයක් ගන්නා ගණුදෙනු හා සිද්ධීන් පිළිබඳ තොරතුරු වාර්තා කිරීම හා සන්නිවේදනය කිරීම
2. මූල්‍ය හා මූල්‍ය නොවන තොරතුරු රැස් කිරීම, වර්ග කිරීම, වර්තා කිරීම, විශ්ලේෂණය හා සන්නිවේදනය කිරීම
3. මූල්‍යමය ස්වරූපයක් ගන්නා ගණුදෙනු හා සිද්ධීන් පිළිබඳ තොරතුරු රැස් කිරීම, වර්ග කිරීම, වාර්තා කිරීම විශ්ලේෂණය කිරීම හා සන්නිවේදනය කිරීම
4. ගණුදෙණු හා සිද්ධීන් පිළිබඳ තොරතුරු උපයෝගී පොත්වල හා ලෙජර් ගිණුම්වල වර්තාකර මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම
5. ගණුදෙණු හා සිද්ධීන් මගින් ඇතිවන වත්කම්, වගකීම්, හිමිකම්, ආදායම් හා වියදම් පිළිබඳ තොරතුරු වාර්තා කිරීම හා සන්නිවේදන කිරීම

(………)

(02) ව්‍යාපාරයක බැංකු ගණුදෙණු ජංගම දුරකථන හා පරිගණක මගින් සිදු කිරීමට අවස්ථාව ලැබී ඇත. මෙය කුමන ගිණුම්කරණ පරිසර සාධකයට අදාළ වන්නේ ද?

1. ආර්ථික හා දේශපාලන
2. ශිල්පීය හා වෘත්තිය
3. තාක්ෂණික
4. නෛතික
5. සමාජ හා සංස්කෘතික

(………)

(03) සුපුන්ගේ ව්‍යාපාරය පියකරු පරිසරයට පිහිටා ඇත. මූල්‍ය ප්‍රකාශනවල එම පරිසරයේ වටිනාකම පෙන්නුම් කිරීමට නොහැකි වී ඇත. මෙම තත්වය ඇති විටම බලපෑ ඇති ගිණුම් කරන සංකල්පය

1. ඓතිහාසික පිරිවැය
2. මූල්‍ය මිනුම්
3. උපලබ්ධි
4. ප්‍රමාණාත්මක
5. ව්‍යාපාර ඒකක

(………)

(04) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වෙළෙඳ ණයගැතියන්, වෙළෙඳ ණයහිමියන්, උපචිත වියදම් හා කලින් ගෙවීම් වර්තා කරයි. මීට අදාළ වන ගිණුම්කරණ සංකල්පය

1. ආදායම් හඳුනා ගැනීම
2. ඓතිහාසික පිරිවැය
3. ප්‍රමාණාත්මක බව
4. උපචිත
5. යථාරූපී

(.........)

(05) මූල්‍ය ගිණුම්කරණයට අයත් කාර්යන් කිහිපයක් පහත දැක්වේ.

A ජ'නල් වල සටහන් කිරීම

B ගණුදෙනු හා සිද්ධීන් ඇති වීම

C මූලශ්‍ර ලේඛන සකස් කිරීම

D ලේජරයට පිටපත් කිරීම

ඉහත ගිණුම්කරණ කාර්යයන්වල නිවැරදි අනු පිළිවෙල වන්නේ,

1. A B C D
2. B A C D
3. C B A D
4. B C A D
5. B C D A

(.........)

(06) ව්‍යාපාර ආයතනයක සිදු වූ ගණුදෙණු කිහිපයක් පහත දැක්වේ.

* රු 75000 ක තොග ණයට මිල දී ගැනීම.
* රු 50 000 ක තොග රු 60 000 ක අත්පිට විකිණීම
* ණයට මිල දී ගත් තොගවලින් රු 500 ක තොග ආපසු යැවීම

ඉහත ගණුදෙණුවලට අදාළ මූලාශ්‍ර ලේඛන පිළිවෙලින්

1. ඉන්වොයිසිය ලදුපත බැරපත
2. ඉන්වොයිසිය ලදුපත ජ'නල් වවුචරය
3. ඉන්වොයිසිය ලදුපත ගෙවීම් වවුචරය
4. ඉන්වොයිසිය ලදුපත හර පත
5. ලදුපත ඉන්වොයිසිය හරපත

(.........)

(07) මුදල් ලැබීම් හා මුදල් ගෙවීම ජ'නලය සම්බන්ධයෙන් නිවරදි ප්‍රකාශනය වන්නේ,

1. උපයෝගී පොත් මෙන්ම ප්‍රධාන ලෙජර් ගිණුම් දෙකකි.
2. මුදලින් ලැබෙන ආදායම් හා මුදලින් ගෙවන වියදම් වර්තාකරණ ජ'නලයයි.
3. මුදල් ගණුදෙනු සියල්ල පළමුව වර්තා කරන ජ'නල් වේ.
4. මූල්‍ය ප්‍රකාශනවලට අවශ්‍ය තොරතුරු සපයන ජ'නල් වේ.
5. මුදල් ගණුදෙණු වර්තාකරන ලෙජර් ගිණුම් දෙකකි

(.........)

(08) ව්‍යාපාරික ගණුදෙණු කිහිපයක් පහත දැක්වේ.

A සේවක වැටුප් මුදලින් ගෙවීම

B කාර්යාලීය උපකරණ ණයට ගැනීම

C වෙළෙඳ වට්ටම් ලැබීම

D බොල් ණය කපා හැරීම

E කාර්යාලීය ලිපි ද්‍රව්‍ය ණයට ගැනීම

පොදු ජ'නලය තුළ වාර්තා කරන ගණුදෙනු වන්නේ,

1. B C D E
2. B D E
3. D E
4. B C D
5. A B C D E

(.........)

The National e-learning Portal for The General Education

(09) ජනිඳුගේ ව්‍යාපාරයේ 2019-01-01 දිනට වත්කම් රු 100 000 කි. එදිනට වගකීම් රු 40 000 කි. ජනවාරි මාසයේ දී සිදු වූ ගණුදෙණු

01-03 රු 45 000 ක් වටිනා පරිගණකයන් මුදලට ගැනීම

01-15 රු 15 000 ක මුදලක් බැංකුවේ තැන්පත් කිරීම

2019-01-31 දිනට

	වත්කම්	හිමිකම්	වගකීම්
1.	145 000	105 000	40 000
2.	55 000	15 000	40 000
3.	40 000	15 000	25 000
4.	100 000	60 000	40 000
5.	160 000	120 00	40 000

(.........)

(10) ව්‍යාපාර ආයතනයක ශේෂ පිරික්සුම සකස් කිරීමේ අරමුණ වන්නේ,

1. උපයෝගී පොත්වල හා ලෙජර් ගිණුම්වල ඇතිවන වැරදි හඳුනා ගැනීම
2. ලෙජර් ගිණුම් සියල්ල එක් ස්ථානයකට රැස් කිරීම
3. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට අවශ්‍ය තොරතුරු සැපයීම
4. ගිණුම් වර්ෂය අවසාන දිනට පවතින වත්කම් වගකීම් හා හිමිකම් වල වටිනාකම් ඉදිරිපත් කිරීම
5. ලෙජර් ගිණුම්වල ගණිතමය නිවැරදිතාවය පරීක්ෂා කිරීම

(.........)

(11) ව්‍යාපාර ආයතනයකට 2019-01-31 දිනට ලැබුණ බැංකු ප්‍රකාශන අනුව බැර ශේෂය රු 350 000 කි. එදිනට

* ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක් 150 000
* උපලබ්දි නොවූ චෙක් 120 000
* මුදල් පොතේ වර්තා නොවූ බැංකු ගාස්තු 5 000

මුදල් පාලන ගිණුම සංශෝධනය කිරීමට පෙර මුදල් ශේෂය

1. 320 000 2. 325 000 3. 375 000
4. 470 000 5. 315 000

(.........)

(12) ව්‍යාපාරයක ශුද්ධ ලාභය හෝ අලාභය ගණනය කිරීමේ දී යොදාගත හැකි සමීකරණය වන්නේ,

1. අවසාන ශුද්ධ වත්කම් - ආරම්භ ශුද්ධ වත්කම් - ගැනිලි + අමතර ප්‍රාග්ධනය
2. අවසාන ශුද්ධ වත්කම් - ආරම්භක ශුද්ධ වත්කම් + ගැනිලි - අමතර ප්‍රාග්ධනය
3. අවසාන ශුද්ධ වත්කම් - ආරම්භ ශුද්ධ වත්කම් - ගැනිලි - අමතර ප්‍රාග්ධනය
4. ශුද්ධ වත්කම්වල වෙනස - ගැනිලි + අමතර ප්‍රාග්ධනය
5. වත්කම් - වගකීම් + ගැනිලි - අමතර ප්‍රාග්ධනය

(.........)

(13) ආසිරි ව්‍යාපාරය 2019-01-01 දින රු 50 000 ක ලකුණු කළ මිලක් සහිත තොග සමන්තගෙන් ණයට ගන්නා ලදි. අඩුකළ වෙළෙඳ වට්ටම 10%

දින 30 ඇතුළත මුදල් ගෙවනු ලබන්නේ නම් 5% මුදල් වට්ටම් හිමි වේ.

2019-01-25 දින සමන්තට මුදල් ගෙවා ණය පියවන ලදී.

ආසිරි ව්‍යාපාරය සමන්තට ගෙවූ මුදල

1. 45 000 2. 47 500 3. 42 750
4. 42 500 5. 50 000

(.........)

(14) ව්‍යාපාර ආයතනයක් පිරිවැයට 40% ක දළ ලාභ අත්තිකයක් සහිතව විකුණුම් සිදු කරයි. 2019 ජනවාරි මාසයේ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගත්

* විකුණුම් පිරිවැය රු 48 000
* බෙදා හැරීමේ හා පරිපාලන වියදම් රු 24 000

ජනවාරි මාසයේ ශුද්ධ ලාභය හෝ අලාභය

1. ලාභය 19 200
2. අලාභය 5 200
3. අලාභය 24 000
4. ලාභ 4 800
5. ආලාභය 4 800

(.........)

■ **පහත තොරතුරු ප්‍රශ්න අංක 15 හා 16 ට අදාළ වේ.**

	2017-04-01 දිනට	2018-03-31 දිනට
වෙළෙඳ ණය ගැතියෝ	5 000	8 000
තොගය	3 000	4 000

2018-03-31 දිනෙන් අවසන් වූ වර්ෂයේ

* විකුණුම් පිරිවැය 120 000
* දළ ලාභය 30 000

(15) 2018-03-31 දිනෙන් අවසන් වූ වර්ෂයේ ගැනුම්වල වටිනාකම

1. 124 000
2. 123 000
3. 121 000
4. 151 000
5. 91 000

(.........)

(16) 2018-03-31 දිනෙන් අවසන් වූ වර්ෂයේ ණයගැතියන්ගෙන් ලද මුදල

1. 158 000
2. 150 000
3. 155 000
4. 147 000
5. 153 000

(.........)

(17) ව්‍යාපාරයක පොත්වලින් 2018-03-31 දිනෙන් අවසන් වූ වර්ෂයට අදාළව උපුටාගත් තොරතුරු

2017-04-01 දිනට ඉදිරියට ගෙවූ වරිපනම් ගාස්තු 1 500
2018-03-31 දිනට උපචිත වරිපනම් ගාස්තු 1 000
වර්ෂය තුලදී ගෙවූ වරිපනම් ගාස්තු 8 000

2018-03-31 දිනෙන් අවසන් වූ වර්ෂයේ ආදායම් ප්‍රකාශන තුළ හඳුනාගන්නා වරිපනම් ගාස්තුව

1. 9 000
2. 10 500
3. 9 500
4. 6 500
5. 7 000

(.........)

(18) ආදායම් ප්‍රකාශනය තුළ ආදායම් හා වියදම් වර්තා කිරීමට පදනම සපයන ගිණුම්කරණ සංකල්පය වන්නේ,

1. උපචිත
2. මූල්‍ය මිනුම්
3. ව්‍යාපාර ඒකක
4. ඓතිහාසික පිරිවැය
5. ආරක්ෂණ

(.........)

(19) ව්‍යාපාරයක ගිණුම් තැබීමේ දී පහත වැරදි සිදු වී ඇත.

- * කපාහරින ලද රු 150 ක බොල් ණය ණයගැති පාලන ගිණුමට පිටපත් කර නැත.
- * ගැනුම් ජ'නලය එකතු කිරීමේ රු 100 වැඩියෙන් එකතු කර ඇත.
- * ණයහිමි පාලන ගිණුම එකතු කිරීමේ දී රු 10 අඩුවෙන් ගණන් ගෙන ඇත.

ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර අවිනිශ්චිත ගිණුමේ ශේෂය

1. රු 150 හර ශේෂය
2. රු 150 බැර ශේෂය
3. රු 160 හර ශේෂය
4. රු 160 බැර ශේෂය
5. රු 50 බැර ශේෂය

(.........)

(20) භාණ්ඩ බෙදා හරින ව්‍යාපාරයක 2018-03-31 දිනෙන් අවසන් වූ වර්ෂයේ ආදායම් ප්‍රකාශයෙන් උපුටාගත් තොරතුරු

විකුණුම්	රු	96 000
විකුණුම් පිරිවැය	රු	72 000

විකුණුම් පිරිවැය ගණනය කිරීමේ දී පහත ගැලපීම් වර්තා කර නැත.

- * හානි වූ තොගයේ පිරිවැය රු 500
- * පොත්වල වර්තා නොවූ භාණ්ඩ ගැනිලි රු 200

නිවරදි විකුණුම් පිරිවැය

1. 72 500
2. 71 500
3. 72 700
4. 71 800
5. 71 300

(.........)

(21) ව්‍යාපාරයක් උපායගත් ශුද්ධ ලාභය තුළින් ඇතිවන අවසාන ප්‍රතිඵලය වන්නේ,

1. වත්කම් වැඩිවීම
2. වත්කම් හා හිමිකම් වැඩිවීම
3. රඳවාගත් ඉපයීම වැඩිවීම
4. වත්කම් වතකීම් හා හිමිකම් වැඩිවීම
5. මුදල් වැඩිවීම

(.........)

(22) ව්‍යාපාරයක 2019 ජනවාරි මාසයේ සේවක වැටුප් පිළිබඳ විස්තර

සේවකයන්ට ගෙවූ ශුද්ධ වැටුප	රු	9 000
අර්ථ සාධන අරමුදල් සේවක දායකය	රු	1 000
අර්ථ සාධන වියදම්	රු	1 500

ජනවාරි මාසයේ සේවකයන් වෙනුවෙන් දරන ලද මුළු වියදම

1. 10 000
2. 9 000
3. 11 500
4. 10 500
5. 9 500

(.........)

(23) ව්‍යාපාරයක 2018-03-31 දිනට පැවති මෝටර් රථ පිළිබඳ විස්තර

මෝටර් රථ පිරිවැය	රු	600 000
සමුච්ත ක්ෂය	රු	180 000

මෙම මෝටර් රථය රු 30 000 ක ආලාභයකට විකුණ ඇත. මෝටර් රථයේ විකුණුම් මිල වන්නේ,

1. 420 000
2. 570 000
3. 450 000
4. 390 000
5. 750 000

(.........)

The National e-learning Portal for The General Education

(24) ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශනවලින් උපුටාගත් තොරතුරු

	2017-03-31 දිනට	2018-03-31 දිනට
ප්‍රාග්ධන ගිණුම	8 000	8 000
රඳවාගත් ඉපයුම් ගිණුම	1 500	2 100

වෙනත් තොරතුරු

වාර්ෂික ගැනිලි රු 300

2018-03-31 දිනෙන් අවසන් වර්ෂයේ උපයා ඇති ශුද්ධ ලාභය

1. 600 2. 300 3. 2100 4. 900 5. 3 600

(.........)

(25) ජංගම ගිණුමක් මඟින් මුදල් ගණුදෙණු කරන ව්‍යාපාරයක මුදල් පාලන ගිණුමේ ශේෂයට වඩා බැංකු ගිණුම් ප්‍රකාශනයේ ශේෂය වැඩි වීමට බලපාන ගණුදෙණුව වන්නේ,

1. බැංකුව අයකළ ගාස්තුව රු 200
2. තැන්පත් කළ උපලබ්දි නොවූ චෙක් රු 3000
3. බැංකුවේ තැන්පත් කළ මුදල රු 4000
4. ණයගැති සෘජු ප්‍රේෂණ රු 1000
5. නිකුත් කරන ලද රු 1500 ක චෙක්පතකට බැංකුව මුදල් ගෙවා ඇත. (.........)

■ **අංක 26 සිට 40 දක්වා ප්‍රශ්නවලට කෙටි හා නිශ්චිත පිළිතුරු තිත් ඉර මත ලියන්න.**

(26) තනි ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශනවලින් සපයන තොරතුරු භාවිතා කරන

* අභ්‍යන්තර පර්ශවය ....
* බාහිර පාර්ශවයන් දෙකක් ....

(27) පොදු ලෙජරය හා උප ලෙජරය අතර පවතින වෙනස් නම් දෙකක් ලියන්න.

1. ....
2. ....

(28) පහත සඳහන් ප්‍රකාශන **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න සඳහන් කරන්න.

1. ව්‍යාපාරයක ණයට මිල දී ගැනුම් සියල්ල ගැනුම් ජ'නලය තුළ වර්තා කරයි. ....
2. සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීමේදී වත්කම් අඩුවේ. ....

(29) පහත සඳහන් ලෙජර් ගිණුම් වත්කම්, වගකීම් හිමිකම්, ආදායම්, වියදම් ලෙස වර්ග කර දක්වන්න.

ලෙජර් ගිණුම	ගිණුම් වර්ගය
1. ගැනුම් ගිණුම	....
2. ආපසු එවුම් ගිණුම්	....
3. උපචිත විදුලි ගාස්තු ගිණුම	....
4. ගැනිලි ගිණුම	....

e තක්සලාව The National e-learning Portal for The General Education

■ **ප්‍රශ්න අංක 30, 31 ට පහත තොරතුරු අදාළ වේ.**

ව්‍යාපාරයක 2018-03-31 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය රු 6500 කි. ශේෂ ලැයිස්තුවේ එකතුව පාලන ගිණුමේ ශේෂය සමඟ එකඟ නොවිය. පහත වැරදි අනාවරණ විය.

1. රු 600 ක විකුණුම් ඉන්වොයිසියක් පොත් වලින් සම්පූර්ණයෙන් මග හැරී ඇත.
2. විකුණුම් ජ'නලය එකතු කිරීමේ දී රු 100 ක් වැඩියෙන් එකතු කර ඇත.
3. කමල්ට ණයට විකුණුම් රු 800 ක් වූ අතර එය විකුණුම් ජ'නලයෙන් කමල්ගේ ගිණුමට රු 80 ලෙස පිටපත් කර ඇත.

(30) ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර ණය ගැති ශේෂ ලැයිස්තුවේ එකතුව

....

....

(31) ඉහත වැරදි නිවැරදි කළ පසු ශේෂ ලැයිස්තුවේ අගය

....

■ **ප්‍රශ්න අංක 32, 33 ට පහත තොරතුරු අදාල වේ.**

එකතු කළ අගය මත බදු (VAT) ලියා පදිංචි සමාගමක 2019 ජනවාරි මාසයේ ණයට ගැනුම් හා විකුණුම් පිළිබඳ තොරතුරු

විස්තරය	විකුණුම් මිල	ගැනුම් මිල	VAT බදු	මුළු වටිනාකම
විකුණුම්	5 000	-	750	5 750
ගැනුම්	-	3 000	450	3 450

වෙනත් තොරතුරු VAT බදු මුදලින් ගෙවීම් රු 100

The National e-learning Portal for The General Education

(32) ණයට විකුණුම් වර්තා කිරීමේ ජ'නල් සටහන

....

....

(33) පොදු ලෙජරයේ VAT බදු පාලන ගිණුමේ ශේෂය

....

....

(34) ගිණුම් කාලපරිච්ඡේදය අවසනයේ පහත ගැලපීම් සටහන් වර්තා කිරීමෙන් ශුද්ධ ලාභයට ඇතිවන බලපෑම

		ශුද්ධ ලාභය		
		වැඩිවේ	අඩුවේ	වෙනස් නොවේ
1. උපචිත විදුලි ගාස්තු	600	....	....	....
2. ඉදිරියට ගෙවූ ප්‍රමාණය වියදම්	400	....	....	....
3. වර්ෂක ක්ෂය වීම්	1000	....	....	....
4. ලැබිය යුතු පොලී ආදායම්	480	....	....	....

(35) බැංකු සැසඳුම් ප්‍රකාශනයක් සකස් කිරීමේ දී අවශ්‍යතාවයන් දෙකක් සඳහන් කරන්න.

1. ....

2. ....

■ **අංක 36, 37 ප්‍රශ්නවලට පහත තොරතුරු අනුව වේ.**

ව්‍යාපාර ආයතනයක මුලය ප්‍රකාශනවලින් උපුටාගත් තොරතරු

1. 2018-03-31 දිනෙන් අවසන් වර්ෂයේ ශුද්ධ ලාභය 62 500
2. 2018-03-31 දිනට ගබඩාවේ පැවති තොගය 8 000

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී පහත ගැලපුම් සටහන් මග හැරී ඇත.

1. විකුණුම් මිල රු 6 000 ක තොග 2018-03-25 දින විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත ගණුදෙණුකරුවකු වෙත යවා ඇත. එය ණයට විකුණුම් ලෙස සටහන් කර ඇත. මෙම තොගයේ පිරිවැය රු 4500 ක් වූ අතර 2018-03-31 දිනට මෙම තොගය විකුණා නැත.
2. පොත්වල වර්තා නොවූ ආපසු යැවුම් රු 200 කි.

(36) නිවැරදි ශුද්ධ ලාභය

....

(37) 2018-03-31 දිනට ගැලපිලි සටහන් වර්තා කිරීමේ පසු 2018-03-31 දිනට

වත්කම්වල වැඩිවීම / අඩුවීම ....

වගකීම්වල වැඩි වීම / අඩුවීම ....

(38) ව්‍යාපාරයක සිදු වූ ගණුදෙණු කිහිපයක් පහත දක්වේ. එම ගණුදෙනුවලින් වෙළඳ ණය හිමියන්ට ඇතිවන බලපෑම **වැඩිවේ, අඩුවේ වෙනස් නොවේ** යන්න සඳහන් කරන්න.

1. කාර්යාලීය ලිපි ද්‍රව්‍ය ණයට ගැනීම් ....
2. වෙළෙඳ වට්ටම් ලැබීම් ....
3. වෙළෙඳ තොග ආපසු යැවීම ....
4. රක්ෂණ ගාස්තු සඳහා නිකුත් කළ චෙක් පත අගරු වීම ....

The National e-learning Portal for The General Education

■ **පහත තොරතුරු ප්‍රශ්න අංක 39 හා 40 ට අදාළ වේ.**

ව්‍යාපාරයක 2018-03-31 දිනට පැවති ජංගම නොවන වත්කම් පිළිබඳ තොරතුරු

වත්කම	මිල දී ගත් දිනය	පිරිවැය (ගත් මිල)	2018-03-31 දිනට සමුචිත ක්ෂය	ඵලදායි ජීව කාලය
මෝටර් රථය	2017-04-01	60 000	5 000	10
කාර්යලීය උපකරණ	2017-04-01	15 000	1 500	10

* සෑම ගිණුම් වර්ෂයක්ම මාර්තු 31 දිනෙන් අවසන් වේ. 2018-03-31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

(39) 1. මෝටර් රථවල වාර්ෂික ක්ෂය ....

2. කාර්යලීය උපකරණවල වර්ෂි ක්ෂය ....

(40) 2017-04-01 දිනට

i. මෝටර් රථවල ක්ෂය කළ හැකි අගය ....

ii. කාර්යාලීය උපකරණවල ක්ෂය කළ හැකි අගය ....

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

33 | S | II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ සස් පෙළ) විභාගය - දෙවන වාර පරීක්ෂණය - 2019 මාර්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - இரண்டாம் தவணைப் பரீட்சை - 2019 மார்ச்
General Certificate of Education (Adv. Level) - Second Term Test - March 2019

12 ශ්‍රේණිය
Grade12

ගිණුම්කරණය - II
Accounting - II

පැය දෙකයි මි. 10
Two hours & 10 min

උපදෙස් :

- පළමු හා දෙවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම පිළිතුරු ලිවීම අලුත් කඩදාසියකින් ආරම්භ කරන්න.
- අදාල පෙරවැඩ පිළිතුරුපත්‍රය සමග අමුණානන්න.

I කොටස

(01) සම්පත්ගේ ව්‍යාපාරයේ පොත්වලින් 2018-03-31 දිනට උපුටාගත් ශේෂ පිරික්සුම (රු 000)

	හර	බැර
විකුණුම්		17 050
ගැනුම්	8 800	
2017-04-01 තොගය	760	
වෙළෙඳ ණය ගැතියෝ	830	
වෙළෙඳ ණයහිමියෝ		780
මුදල් පාලන ගිණුම	3 920	
ආපසු එවුම්	160	
2017-04-01 දිනට ණය ගැතියන් සඳහා හානිකරන අලාභ ඉඩ හැරීම		100
ප්‍රචාරණය	630	
සේවක වැටුප් ගිණුම	1 000	
විදුලි ගාස්තු	560	
ඉඩම් හා ගොඩනැගිලි පිරිවැයට	8 600	
මෝටර් රථ පිරිවැයට	4 300	
කාර්යාලීය උපකරණ පිරිවැයට	1 600	
2017-04-01 දිනට සමුච්චිත ක්ෂය		
මෝටර් රථ		1 100
කාර්යාලීය උපකරණ		340
ප්‍රාග්ධන ගිණුම		6 600
2017-04-01 දිනට රඳවාගත් ඉපයුම්		3 200
ගණුදෙණුකරුවකුගෙන් ලද අත්තිකාරම්		150
ගැනිලි	400	
ලැබූ බදු කුලී	480	
බැංකු ණය ගිණුම		1 760
	31 560	31 560

වෙනත් තොරතුරු

1. 2018-03-31 දිනට ඉතිරි තොගය පිරිවැය 900 000 කි.
2. ණය ගැතියන්ගෙන් රු 30 000 ක් බොල්ණය ලෙස කපා හැරිය යුතු අතර හානිකරණ අලාභ ඉඩ හැරීම (අඩමාණ ණය වෙන් කිරීම) 10% ක් ලෙස තබාගත යුතුය.
3. දේපල පිරියත හා උපකරණ පහත පරිදි වාර්ෂිකව ක්ෂය කළ යුතුව ඇත.

   මෝටර් රථ පිරිවැය මත 10%

   කාර්යාල උපකරණ පිරිවැය මත 15%
4. 2018-03-31 දිනට උපචිත වැටුප් රු 120 000 ක් වූ අතර ඉදිරියට ගෙවූ ප්‍රචාරණය රු 50 000 කි.
5. ගොඩනැගිල්ලෙන් කොටසක් 2017-09-01 දින රු 480 000 වූ වාර්ෂික කුලියට බදු දී ඇත. වර්ෂයක් සඳහා ලැබුණු බදු කුලිය පොත්වල සටහන් කර ඇත.
6. 2018-03-31 දිනට ලැබියයුතු කොමිස් මුදල රු 60 000 කි.
7. පොත්වල වාර්තානොවූ භාණ්ඩ ගැනිලි රු 30 000 කි.
8. වර්ෂය තුළ දී ගෙවන ලද බැංකු ණය වාරික රු 620 000 ක් බැංකු ණය ගිණුමට හර කර ඇත. මෙම ණය වාරිකය තුළ ඇතුළත් රු 240 000 ක ණය පොලී පිළිබඳ ගිණුම් තබා නැත.
9. වෙළෙඳ ණය හිමියෙකුට මුදල් ගෙවීමේ දී අඩු කරන ලද 50 000 ක වට්ටම් පොත්වල සටහන් කර නැත.
10. ගණුදෙණුකරුවකුගෙන් ලැබී පොත්වල වාර්තාකර ඇති අත්තිකාරම් වෙනුවෙන් විකුණුම් මිල රු 100 000 භාණ්ඩ ගණුදෙනුකරුට 2018-03-25 දින භාරදුන් නමුත් ඒ පිළිබඳව පොත්වල ආදාල සටහන් තබා නැත.

අවශ්‍ය වන්නේ,

i. 2018-03-31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය
ii. 2018-03-31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ලකුණු 20)

The National e-learning Portal for The General Education

(02) ප්‍රදීපාගේ ව්‍යාපාරයේ මුදල් ගණුදෙණු ජංගම ගිණුමක් මඟින් කරනු ලැබේ. 2019 ජනවාරි මාසයේ දී කරන ලද මුදල් ගණුදෙණු

දිනය	චෙක් අංකය	ගණුදෙනුව	(රු 000)
01-01	-	අත්පිට විකුණුම්	610
01-02	2310	සරත්ගෙන් ලැබීම් (දුන් වට්ටම 10)	300
01-03	0981	සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම	70
01-06	7103	අත්පිට විකුණුම්	810
01-08	0982	සේවක වැටුප් ගෙවීම්	160
01-12	0983	ප්‍රචාරණ වියදම් ගෙවීම්	48
01-15	0984	මුදල් ගැනිලි	20
01-18	1324	අකිලගෙන් ලැබීම් (දුන් වට්ටම 20)	560
01-19	0985	කාර්යාලීය උපකරණ ගැනුම්	80
01-21	0986	ප්‍රභාත්ට ගෙවීම් (ලද වට්ටම 15)	420
01-22	0987	කුමාරට ගෙවීම් (ලද වට්ටම් 20)	380
01-24	0988	අත්පිට ගැනුම්	560
01-25	0989	භාණ්ඩ මිල දී ගැනීම සඳහා සමීරට ගෙවූ අත්තිකාරම්	150
01-27	-	බැංකු ණය ලබා ගැනීම	500
01-28	1421	ලැබූ ගෙවල් කුලී	360
01-30	0990	අත්පිට ගැනුම්	615

වෙනත් තොරතුරු

1. 2019-01-01 දිනට පැවති වත්කම් හා වගකීම් කිහිපයක් මෙසේය

	රු.
බැංකු ශේෂය	1 580 000
සුළු මුදල් ගිණුමේ ශේෂය	30 000
වෙළෙඳ ණය ගැතියෝ	1 880 000
වෙළෙඳ ණය හිමියෝ	2 060 000

2. ජනවාරි මාසය සඳහා අනෙකුත් ජ'නල්වලින් උපුටාගත් තොරතුරු

	රු.
විකුණුම් ජ'නලයේ එකතුව	1 920 000
ගැනුම් ජ'නලයේ එකතුව	1 640 000
ආපසු එවුම් ජ'නලයේ එකතුව	30 000
ආපසු යැවුම් ජ'නලය එකතුව	20 000

3. සුළු වියදම් ගෙවීම් ජ'නලයට අනුව වියදම් තීරුවල එකතුන්

	රු.
ගමන් වියදම්	15 000
සංග්‍රහ වියදම්	18 000
කාර්යාලීය වියදම්	30 000
තැපල් හා දුරකථන	21 000

4. අගරු චෙක්පත්

ණයගැති සරත්ගෙන් ලද අංක 2310 දරන චෙක්පත

ප්‍රචාරන වියදම් සඳහා නිකුත් කළ අංක 0983 දරන චෙක්පත

අවශ්‍ය වන්නේ,

1. ● ලැබීම් ජ'නලය හා ගෙවීම් ජ'නලය

මුදල් පාලන ගිණුම	ණයගැති පාලන ගිණුම	විකුණුම් ගිණුම
සුළු මුදල් පාලන ගිණුම	ණයහිමි පාලන ගිණුම	ගැණුම් ගිණුම
දුන් වට්ටම් ගිණුම	උපචිත ප්‍රචාරණ වියදම් ගිණුම	ගැණුම් අත්තිකාරම් ගිණුම

(03) සඳරුවන් 2019-01-01 දින ලිපිද්‍රව්‍ය අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. 2019 ජනවාරි මාසයෙ දී සිදු වූ ගණුදෙනු (රු 000)

ගණුදෙනු අංකය	ගණුදෙනුව	
01	රු 500 000 ක මුදල්ද රු 300 000 වැන්රථය ද ව්‍යාපාරයට යොදවන ලදී,	
02	ව්‍යාපාර කටයුතු සඳහා ගොඩනැගිලක් කුලියට ලබාගෙන වාර්ෂික බදු කුලිය ලෙස රු. 120 000ක් ගෙවන ලදී.	
03	ලිපි ද්‍රව්‍ය අත්පිට මුදලට ගැනුම්	රු 380 000
04	ණයට මිල දී ගත් ලිපි ද්‍රව්‍ය තොගය	රු 960 000
05	අත්පිට මුදලට විකුණුම් රු 600 000 කි. එහි පිරිවැය	රු 310 000 කි.

06 ණයට විකුණුම් රු 780 000 කි. එහි පිරිවැය රු 460 000 කි.

07 රු 20 000 ක ලිපිද්‍රව්‍ය තොග ආපසු යවන ලදී.

08 වෙළෙඳ ණය ගැතියන්ගෙන් ලද මුදල රු 520 000 කි. දුන් වට්ටම රු 15 000

09 අයිතිකරු විසින් පෞද්ගලික ප්‍රයෝජනය ලබාගත් මුදල් රු 50 000 කි.

10 වෙළෙඳ ණයහිමියන්ට ගෙවූ මුදල රු 360 000 කි. ලද වට්ටම රු 20 000

අතිරේක තොරතුරු

1. වැන්රථවල වාර්ෂික ක්ෂය වීම් රු 60 000 කි.
2. ණයගැති සෘජු ප්‍රේෂණ 10 000 දුන් වට්ටම් 1000
3. ජනවාරි මස දුරකථන බිල රු 8 000 අයිතිකරුගේ පෞද්ගලික මුදලින් ගෙවන ලදී.
4. ජනවාරි මස ආපසු එවුම් රු 40 000 ක් වූ අතර එහි පිරිවැය රු 32 000 කි.
5. බැංකුව අය කළ බැංකු ගාස්තුව රු 10 000 කි.

අවශ්‍ය වන්නේ

i. ඉහත අංක 01 සිට 10 දක්වා ගණුදෙණු ගිණුම්කරණ සමීකරණය ඇතිවන බලපෑම පහත ආකෘතියට අනුව

ගණුදෙනු අංකය	වත්කම්					වගකීම්	වගකීම්	
	දේපල පිරියත හා උපකරණ	ලිප ද්‍රව්‍ය තොග	වෙළෙඳ ණය ගැතියෝ	වෙනත් ලැබිය යුතු දෑ	බැංකු ශේෂය	වෙළෙඳ ණයහිමි	ප්‍රාග්ධනය	රඳවාගත් ඉපයුම්

ii. ජනවාරි මාසය සඳහා ආදායම් ප්‍රකාශනය

iii. ඉහත අතිරේක තොරතුරු වාර්තා කිරීමේ ජ'නල් සටහන් (ලකුණු 20)

(04) අ) එකමුතු ව්‍යාපාරයේ 2018-03-31 දිනට සකස් කරන ලද ශේෂ පිරික්සුම අසමාන වී ඇත. ගණනය කරන ලද කෙටුම්පත් ලාභය රු 825 000 කි. ගිණුම් පොත් පරීක්ෂා කිරීමේ දී පහත වැරදි හා මඟහැරීම් අනාවරණය වී ඇත.

1. ගෙවූ රු 62 000 ක දුරකථන ගාස්තු මුදල් ගෙවීම් ජ'නලයේ සටහන් කර දුරකථන ගාස්තු ගිණුමට රු 67 200 ලෙස පිටපත් කර ඇත.
2. මුදල් ලැබීම් ජ'නලයේ ණයගැති විශ්ලේෂණ තීරුව එකතු කිරීමේ දී රු 10 000 ක් වැඩියෙන් ගණනය වී ඇත.
3. රු 17 500 ක අත්පිට විකුණුම් ණයට විකුණුම් ලෙස පොත්වල සටහන් කර ඇත.
4. වර්ෂය තුල කපාහරිනලද රු 3000 ක බොල් ණය ආපසු ලැබී ලැබුණ අතර එය මුදල් ලැබීම් ජ'නල්යෙන් බොල්ණය ගිණුමට හර කර ඇත.
5. 2018-03-31 දින අත්පිට මුදලට ගත් රු 120 000 ක කාර්යාලීය උපකරණ මුදල් ගෙවීම් ජ'නලයෙන් ගැනුම් ගිණුමට පිටපත් කර ඇත.
6. මුදල් ගෙවීම් ජ'නලයේ වර්තාකර තිබු රු 6 000 ක ගෙවූ කොමිස් ලෙජයේ ලද කොමිස් ගිණුමට බැර කර ඇත.

අවශ්‍ය වන්නේ,

1. වැරදි නිවරදි කිරීමට ජ'නල් සටහන්
2. ලාභ සංශෝධන ලේඛනය

ආ) රෙදිපිළි අලෙවිකරන ව්‍යාපාරයක් පවත්වාගෙන යන දර්ශන, ජංගම ගිණුමක් මගින් මුදල් ගණුදෙණු කරනු ලැබේ. මුදල් ගණුදෙනු වලට ආදල තොරතුරු

1.

2019 ජනවාරි මාසය

මුදල් සාරාංශය (රු 0000)

දිනය	විස්තරය	චෙක් අංකය	මුදල	දිනය	විස්තරය	චෙක් අංකය	මුදල
01-01	ශේෂය	-	360	01-01	ගැනුම් නාලක සමාගම	901	310
01-03	මුදල් තැන්පතු	-	120	01-12	සේවක වැටුප්	902	190
01-12	රුවන්	0732	270	01-15	සාගරික සමාගම	903	370
01-15	අසිත	0333	420	01-18	ලක්සිරි	904	210
01-18	සමීර	1412	310	01-21	සිරිමල්	905	150
01-24	දිල්කි	0533	190	01-23	අරුණ සමාගම	906	160
				01-31	ශෙ/ප/ගෙ		280
			1670				1670

e-තක්සලාව TM The National e-Learning Portal for The General Education

2. වෙනත් තොරතුරු :

ජනවාරි මස මුදල් සාරාංශය හා බැංකු ගිණුම් ප්‍රකාශනය සැසඳීමේ දී පහත තොරතුරු අනාවරණ විය.

* ගෙවීමට ඉදිරිපත් නොවූ

චෙක් අංකය	වටිනාකම
904	210 000
906	160 000

* උපලබ්දි නොවූ චෙක්

චෙක් අංකය	වටිනාකම
1412	310 000

* ස්ථාවර නියෝග ගෙවීම්

රක්ෂණ වාරිකය 30 000

* බැංකු ගාස්තු 20 000

* සෘජු ප්‍රේෂණ අතුල 65 000

3. 2018 දෙසැම්බර් මාසය සඳහා
බැංකු සැසඳුම් ප්‍රකාශනය

සංශෝධිත මුදල් ගිණුමේ ශේෂය	360 000
+ ගෙවීමට ඉදිරිපත් නොවුචෙක්	
897 - අමාලි	130 000
	490 000
(-) උපලබ්දි නොවුචෙක්	
097 - සුපුන්	(180 000)
දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය	310 000

* දෙසැම්බර් මස අවසාන දින පැවති ඉදිරිපත්නොවූ චෙක්පත්‍රය හා උපලබ්ධිනොවූ චෙක් පත්‍රය ජනවාරි මාසය තුලදී නිසි පරිදි ගනුදෙනු වී ඇත.

අවශ්‍ය වනනේ,

1. සංශෝධිත මුදල් ගිණුම
2. ජනවාරි මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශනය
3. ජනවාරි මාසය සඳහා බැංකු ගිණුම් ප්‍රකාශය (පහත ආකෘතියට අනුව)

(රු 000)

දිනය	විස්තරය	චෙක් අංකය	හර	බැර	ශේෂය
01-01	ශේෂය	-	-	-	310

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

දෙවන වාර පරීක්ෂණය - 2019

12 ශ්‍රේණිය **ගිණුම්කරණය** **විසඳුම් පත්‍රය**

I - පත්‍රය

ප්‍රශ්න අංකය	පිළිතුරු අංකය	ප්‍රශ්න අංකය	පිළිතුරු අංකය	ප්‍රශ්න අංකය	පිළිතුරු අංකය	ප්‍රශ්න අංකය	පිළිතුරු අංකය	ප්‍රශ්න අංකය	පිළිතුරු අංකය	ප්‍රශ්න අංකය	පිළිතුරු අංකය
01.	3	02.	3	03.	2	04.	4	05.	4	06.	4
07.	3	08.	2	09.	4	10.	5	11.	2	12.	2
13.	3	14.	5	15.	3	16.	4	17.	2	18.	1
19.	4	20.	5	21.	2	22.	3	23.	4	24.	4
25.	4										

(එක් පිළිතුරකට ලකුණු 2 බැගින් ලකුණු 50යි.)

26. 1. කළමණාකරුවන්, අයිතිකරුවන් (තනි ව්‍යාපාර නිසා) (01)
    2. සේවකයින් ගනුදෙනුකරුවන් ණය සැපයුම්කරුවන් රාජ්‍ය ආයතන, වෘත්තීය සමිති (01)

27.

පොදු ලෙජරය	උප ලෙජරය
* ද්විත්ව සටහන් සම්පූර්ණ කරයි.	* තනි සටහන් ලෙස වාර්තාකරයි. (සිහිවටන වාර්තා)
* පාලන ගිණුම් තබාගනී	* පාලන ගිණුම් තබා නොගනී
* ශේෂ පිරික්සුමත් සකස් කරයි	* ශේෂ ලැයිස්තුවක් සකස් කරයි.

(එක් පිළිතුරකට ලකුණු 1 බැගින් ලකුණු 2යි.)

28. 1. අසත්‍යයි (01) 2. අසත්‍යයි (01)

29. 1. වියදම් 2. ආදායම් 3. වගකීම් 4. හිමිකම් (පිළිතුරු දෙකකට ලකුණු 1 බැගින් ලකුණු 2යි.)

30. ණයගැති පාලන ගිණුම 6500
    විකුණුම් ජ'නලය වැඩියෙන් එකතු වීම (100) (01)
    කමල්ගේ ගිණුම අඩුවෙන් සටහන් වීම (720) (01)
    5680

(31) ශේෂ ලැයිස්තුවේ අගය 5680
    කමල්ගේ ගිණුම 720 (01)
    අමතක වූ විකුණුම් ඉන්වොයිසිය 600 (01)
    7000

(32) ණයගැති පාලන ගිණුම හර 5750
    විකුණුම් ගිණුම 5000
    VAT පාලන ගිණුම 750 (02)

(33) VAT පාලන ගිණුම

ණයහිමි	450 (01)	ණයගැති	750 (01)
මුදල	100		
ප/ගෙ	200		
	750		750
		ඉ/ගෙ	200

(34) 1. අඩුවේ 600 2. වැඩිවේ 400 3. අඩුවේ 400 4. වැඩිවේ 480 පිළිතුරු 02කට ලකුණු 01 බැගින් ලකුණු 02

(35) බැංකු ගණුදෙනුවල නිවැරදිතාවය පරීක්ෂාකර බැලීම
    මුදල් පාලන උපක්‍රමයක් ලෙස භාවිත කිරීම
    තැන්පත් කළ නමුත් උපලබ්දි නොවූ චෙක් පිළිබඳ තොරතුරු සැපයීම (02)
    නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක් පිළිබඳ තොරතුරු සැපයීම

(36) නිවැරදි ශුද්ධ ලාභය 62500
    (4500 - 6000) (1500) (01)
    61000
    ආපසු යැවුම් 200 (01)
    61200

හෝ

62500 - 6000 + 4500 + 200 = 61200

e-තක්සලාව The National e-learning Portal for The General Education

(37) 1. වත්කම් අඩුවීම 1500 (01) වගකීම් අඩුවීම 200 (01)

(38) 1. වෙනස් නොවේ 2. අඩුවේ 3. වෙනස් නොවේ 4. වෙනස් නොවේ පිළිතුරු 02කට ලකුණු 01 බැගින් ලකුණු 02

(39) මෝටර් රථ 5000 (01)

කාර්යාලිය උපකරණ 1500 (01)

(40) 1. 5000 x 10 = 50000 (01)

2. 1500 × 10 = 15000 (01)

II - පත්‍රය - A කොටස

(01) i.

සම්පත් ව්‍යාපාරය
2018-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ආදායම් ප්‍රකාශය / ලාභ හෝ අලාභ ප්‍රකාශය (01)

			රු. 000	
විකුණුම්			17 150	(02)
(-) ආපසු එවුම්			(160)	(01)
			16 990	
මුල තොගය		760		
+ ගැණුම්	8 800 (01)			
- ගැණිලි	(30) (01)	8 770		
විකිණීමට ඉදිරිපත් කළ තොගය		9 530		
- අග තොගය		(900)	(01)	
විකුණුම් පිරිවැය			(8 630)	
දළ ලාභය			8 360	(01)
වෙනත් ආදායම්				
බදු කුලී		280 (01)		
කොමිස්		60 (01)		
ලද වට්ටම්		50 (01)		
			390	
			8 750	
බෙදා හැරීමේ වියදම්				
බොල් ණය	30 (01)			
ප්‍රචාරණය	580 (01)			
මෝටර් රථ ක්ෂය	430 (01)			
හානි කරන අලාභ	(20) (01)	1020		
පරිපාලන වියදම්				
වැටුප්	1 120 (01)			
කාර්යාල උපකරණ ක්ෂය	240 (01)			
විදුලිය	560 (01)	1 920		
මූල්‍ය වියදම්				
බැංකු ණය පොලී	240 (01)	240	(3180)	
ශුද්ධ ලාභය			5 570	(01)

(ලකුණු 20)

ii.

සම්පත්ගේ ව්‍යාපාරය

2018-03-31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය (01)

රු. 000

ජංගම නොවන වත්කම්	පිරිවැය	සමු. ක්ෂය	ධාරන අගය
ඉඩම් හා ගොඩනැගිලි	8 600	-	8 600
මෝටර් රථ	(01) 4 300	1 530 (01)	2 770
කාර්යාල උපකරණ	1 600	580 (01)	1 020
	14 500	2 110	12 390 (01)
ජංගම වත්කම්			
තොගය		900 (01)	
වෙළඳ ලැබිය යුතු දෑ (ණයගැතියෝ)	800 (01)		
(-) හානිකරණ අලාභ ඉඩ හැරීම්	(80) (01)	720	
ඉදිරියට ගෙවූ ප්‍රචාරණ		50 (01)	
ලැබිය යුතු කොමිස්		60 (01)	
මුදල්		3 920 (01)	5 650
			18 040
ප්‍රාග්ධනය			6 600
රඳවාගත් ඉපයුම් (17-04-01)		3 200 (01)	
+ ශුද්ධ ලාභය		5 570 (01)	
- ගැනිලි		(430) (02)	8 340
			14 940
ජංගම නොවන වගකීම්			
බැංකු ණය			2 000 (01)
ජංගම වගකීම්			
වෙළඳ ගෙවිය යුතු දෑ (ණය හිමියෝ)		730 (01)	
කලින් ලද ගෙවල් කුලී		200 (01)	
උපචිත වැටුප්		120 (01)	
විකුණුම් අත්තිකාරම්		50 (01)	1 100
			18 040

(ලකුණු 20)

(මුළු ලකුණු 40)

(02) i.

ලැබීම් ජ'නලය

රු. 000

දිනය	විස්තරය	චෙක්පත් අංකය	වට්ටම්	මුදල්	අත්පිට විකුණුම්	ණයගැති ලැබීම	වෙනත් ආදායම්	වෙනත් ලැබීම්
1/1	විකුණුම්			610	(01) 610			
1/2	සරත්	2310	10	300		300 (01)		
1/6	විකුණුම්	7103		810	(01) 810			
1/18	අකිල	1324	20	560		560 (01)		
1/27	බැංකු ණය			500				(01) 500
1/28	ගෙවල් කුලී	1421		360			(01) 360	
	පොදු ලෙජරයට මාරු කලා		(01) 30	3 140	1 420	860	360	500

(ලකුණු 07)

ගෙවීම් ජ'නලය රු. 000

දිනය	විස්තරය	චෙක්පත් අංකය	වට්ටම්	මුදල්	අත්පිට ගැනුම්	ණය හිමි ගෙවීම්	වියදම්	වෙනත් ගෙවීම්
1/3	සුළු මුදල්	0981		70				(01) 70
1/8	වැටුප්	0982		160			(01) 160	
1/12	ප්‍රචාරණය	0983		48			(01) 48	
1/15	ගැනිලි	0984		20				(01) 20
1/19	කාර්යාල උපකරණ	0985		80				(01) 80
1/21	ප්‍රභාත්	0986	15	420		(01) 420		
1/22	කුමාර	0987	20	380		(01) 380		
1/24	ගැණුම්	0988		560	(01) 560			
1/28	සමීර /අත්තිකාරම්	0989		150				(01) 150
1/30	ගැනුම්	0990		615	(01) 615			
	පොදු ලෙජරයට මාරු කළා		(01) 35	2503	1 175	960	48	320

(ලකුණු 11)

ii. මුදල් පාලන ගිණුම්

ශේ/ඉ/ගෙ	1 580	ගැණුම්	1 175
අත්පිට විකුණුම්	1 420	ණය හිමි පාලන	800
ණය ගැති පාලන	860	වියදම් - ප්‍රචාරණය	298
වෙනත් ආදායම්	360	වෙනත් ගෙවීම්	320
වෙනත් ලැබීම්	500		
උපචිත ප්‍රචාරණ	48		
		ශේෂය/ප/ගෙ	1 965
	4 768		4 768
ශේෂය /ඉ/ගෙ	1 965		

(අයිතම 02කට ලකුණු 1 බැගින් ලකුණු 05)

සුළු මුදල් පාලන ගිණුම

ශේෂය/ඉ/ගෙ	30	වියදම්		
මුදල් පාලන	70	ගමන් වියදම්	15	} 84
		සංග්‍රහ	18	
		කාර්යාලීය	30	
		තැපැල් හා දුරකථන	21	
		ශේෂය /ප/ගෙ		16
	100			100
ශේෂය /ඉ/ගෙ	16			

(අයිතම 02කට ලකුණු 1 බැගින් ලකුණු 03)

The National e-learning Portal for The General Education

ණයගැති වෙළඳ ලැබිය යුතු දෑ පාලන ගිණුම

රු. 000

ශේෂය/ඉ/ගෙ	1 880	දුන් වට්ටම්	30
විකුණුම්	1 920	මුදල්	860
අගරු චෙක්	300	ආපසු එවුම්	30
අහිමිකළ දුන් වට්ටම්	10		
		ශේෂය /ෂ/ගෙ	3 190
	4 110		4 110
ශේෂය/ඉ/ගෙ	3 190		

(අයිතම 02කට ලකුණු 1 බැගින් ලකුණු 03)

ණයහිමි වෙළඳ ගෙවිය යුතු දෑ පාලන ගිණුම

රු. 000

ලද වට්ටම්	35	ශේෂය/ඉ/ගෙ	2 060
මුදල්	960	ගැණුම්	1 640
ආපසු යැවුම්	20		
ශේෂය/ප/ගෙ	2 685		
	3 700		3 700
		ශේෂය/ඉ/ගෙ	2 685

(අයිතම 02කට ලකුණු 1 බැගින් ලකුණු 02)

ගැනුම් අත්තිකාරම්

මුදල් පාලන (01)	150	ශේෂය/ප/ගෙ	150
	150		150
ශේෂය/ඉ/ගෙ	150		

විකුණුම් ගිණුම

		මුදල්	1420 (01)
ශේෂය ප/ගෙ	3340	ණයගැති පාලන	1920 (01)
	3340		3340

ගැනුම් ගිණුම

මුදල්	1 175 (01)	ශේෂය /ප/ගෙ	2 815
ණය හිමි පාලන	1 640 (01)		
	2 815		2 815
ශේෂය/ඉ/ගෙ	2815		

දුන් වට්ටම් ගිණුම

ණය ගැති පාලන	(01) 30	ණය ගැති පාලන	10 (01)
		ශේෂය/ප/ගෙ	20
ශේෂය/ඉ/ගෙ	30		30

ලද වට්ටම් ගිණුම

ශේෂය/ප/ගෙ	35	ණයහිමි පාලන	35 (01)
	35		35
		ශේෂය/ඉ/ගෙ	35

උපචිත ප්‍රචාරණ

ශේෂය/ප/ගෙ	48	මුදල් පාලන	48 (01)
	48		48
		ශේෂය/ඉ/ගෙ	48

(ලකුණු 09)

(මුළු ලකුණු 40)

(03) i.

(රු 000)

ගණුදෙණු අංකය	දේපළ පිරියත උපකරණ	ලිපිද්‍රව්‍ය තොග	වෙළඳ ලැබිය යුතු දෑ	වෙනත් ලැබිය යුතු දෑ	මුදල්	වෙළඳ ගෙවිය යුතු දෑ	ප්‍රාග්ධනය	රඳවාගත් ඉපයුම්
1	+300				+500		+800	(02)
2				+110	-120			-10 (02)
3		+380			-380			(02)
4		+960				+960		(02)
5		-310			+600			+290 (02)
6		-460	+780					+320 (02)
7		-20				-20		(02)
8			-535		+520			-15 (02)
9					-50			-50 (02)
10					-360	-380		+20 (02)
	300	1550	245	110	710	560	800	555

(එක් ගණුදෙනුවකට ලකුණු 02 බැගින්)

(ලකුණු 20)

The National e-learning Portal for The General Education

ii.

සඳරුවන් ව්‍යාපාරය

2019-01-31 දිනෙන් අවසන් මාසය සඳහා

ආදායම් ප්‍රකාශය

විකුණුම් (600 + 780)		1 380	(01)
(-) ආපසු එවුම්		(40)	(01)
(-) විකුණුම් පිරිවැය			
^ 3 1 0 + 460 - 32)		(738)	(02)
		602	
+ ලද වට්ටම්		20	(01)
		622	
(-) ගොඩනැගිලි කුලී	(01) 10		
දුන් වට්ටම්	(01) 16		
වාහන ක්ෂය	(01) 5		
දුරකථන ගාස්තු	(01) 8		
බැංකු ගාස්තු	(01) 10		
		(49)	
ශුද්ධ ලාභය		573	

හෝ

(ලකුණු 10)

විකුණුම්	1380		
ආපසු එවුම්	(40)		
		1340 (01)	
විකුණුම් පිරිවැය			
ගැනුම්		1340	
(-) ආපසු යැවුම්		(20)	
		1320 (01)	
ඉතිරි තොගය			
(550 + 32)	(02)	(582)	(738)
දළ ලාභය			602
+ ලද වට්ටම්			20 (01)
			622
වියදම්			
ගොඩනැගිලි කුලී	10 (01)		
දුන් වට්ටම් (15 +1)	16 (01)		
වාහන ක්ෂය	05 (01)		
දුරකථන ගාස්තු	08 (01)		
බැංකු ගාස්තු	10 (01)		
			(49)
ශුද්ධ ලාභය			573

(ලකුණු 10)

e-තක්සලාව TM
The National e-learning Portal for The General Education

iii. (රු. 000)

1.	වාහන ක්ෂය ගිණුම	හර	05		
	වාහන ක්ෂය වෙන් කිරීම්			05	(02)
	(වාහන ක්ෂය වාර්ග කලා)				
2.	මුදල් පාලන		10		
	දුන් වට්ටම්		01		
	ණයගැති පාලන			11	(02)
3.	දුරකථන ගාස්තු	හර	8		
	ප්‍රාග්ධන ගිණුම			8	(02)
	(දුරකථන ගාස්තු අයිතිකරු පෞද්ගලික මුදලින් ගෙවීම්)				
4.	ආපසු එවුම්	හර	40		
	ණයගැති පාලන /වෙළඳ ලැබිය යුතු දෑ			40	(02)
	(ආපසු එවුම් වාර්තා කිරීම)				
5.	බැංකු ගාස්තු	හර	10		
	මුදල් / මුදල් පාලන			10	(02)
	(බැංකු ගාස්තු වාර්තා කලා)				

(ලකුණු 10)

(මුළු ලකුණු 40)

4) අ

	පොදු ජර්නලය		හර	බැර	
	අවිනිශ්චිත	හර	5200		
1.	දුරකථන ගාස්තු / ලාභ අලාභ			5200	(02)
	(ගෙවූ දුරකථන ගාස්තු 62000, 67200ක් ලෙස දුරකථන ගිණුමේ වාර්තා කිරීම නිවැරදි කළා)				
2.	ණයගැති පාලන /වෙළඳ ලැබිය යුතු දෑ		10000		
	මුදල් පාලන			10000	(02)
	(ලැබීම් ජනලයේ ණය ගැති ලැබීම් තීරුවේ එකතුව වැඩි වීම නිවැරදි කළා)				
3.	මුදල් පාලන	හර	17500		
	වෙළඳ ලැබිය යුතු දෑ			17500	(02)
	(අත්පිට විකුණුවේ, ණයට විකුණුම් ලෙස වාර්තා කිරීම නිවැරදි කළා)				
4.	අවිනිශ්චිත ගිණුම්	හර	6000		
	බොල් ණය / ලාභ අලාභ			6000	(02)
	(ආපසු ලද බොල් ණය, බොල් ණය ගිණුමට හර කිරීම නිවරදි කළා)				
5.	කාර්යාල උපකරණ	හර	120000		
	ගැණුම්			120000	(02)
	(මිලට ගත් කාර්යාල උපකරණ ගැනුම් ගිණුමේ වාර්තා කිරීම නිවැරදි කළා)				
6.	ලද කොමිස්	හර	6000		
	ගෙවූ කොමිස්	හර	6000		
	අවිනිශ්චිත			12000	(04)

(ලකුණු 14)

(සංලක්ෂය නොමැති නම් ලකුණු 2 අඩු කරන්න)

The National e-learning Portal for The General Education

ලාභය සංශෝධනය කිරීමේ ලේඛනය

කෙටුම්පත් ලාභය			825000
දුරකථන ගාස්තු	(01)	5200	
ආපසු ලද බොල් ණය	(01)	6000	
ගැණුම්	(01)	120000	131200
			956200
ලැබූ කොමිස්	(01)	(6000)	
ගෙවූ කොමිස්	(01)	(6000)	(12000)
සංශෝධිත ශුද්ධ ලාභය			944200 (01)

(ලකුණු 06)

අ) i.

සංශෝධිත මුදල් ගිණුම (රු 000)

ශේෂය/ප/ගෙ	280	ස්ථාවර නියෝග/රක්ෂණ	30 (01)
සෘජු ප්‍රේෂණ	(01) 65	බැංකු ගාස්තු	20 (01)
		ශේෂය පා/ගෙ	295
	345		345
ශේෂය ඉ/ගෙ	295		

(ලකුණු 03)

ii.

බැංකු සැසඳුම් ප්‍රකාශනය (රු 000)

සංශෝධිත මුදල් ශේෂය (01)			295
+ ඉදිරිපත් නොවූ චෙක්			
අංක 904	210 (01)		
අංක 906	160 (01)		370
			665
- උපලබ්ධි නොවූ චෙක්			
අංක 1412		(01) 310	(310)
බැංකු ප්‍රකාශය අනුව ශේෂය			355

(ලකුණු 04)

The National e-Learning Portal for The General Education

බැංකු ප්‍රකාශණය

විස්තරය	චෙක්.අංකය	හර	බැර	ශේෂය
ශේෂය ඉ/ගෙ				310
මුදල් - තැන්පත්			120	430
ගෙවීම්	897	130	-	300
තැන්පත්	971		180	480
ගෙවීම්	901	310	-	170
තැන්පත්	0732	-	270	440
ගෙවීම්	902	190	-	250
තැන්පත්	0333	-	420	670
ගෙවීම්	903	370	-	300
ගෙවීම්	905	150	-	150
තැන්පත්	0533	-	190	340
ස්ථාර නියෝග රක්ෂණ	-	30	-	310
බැංකු ගාස්තු	-	20		290
සෘජු ප්‍රේෂණ			65	355
01U/31 ශේෂය				355

(ශේෂය හැර අනෙකුත් එක් එක් ගණුදෙනුව සඳහා ලකුණු 1 බැගින් ලකුණු 13)

The National e-learning Portal for The General Education

පළමු පත්‍රය ලකුණු	80
දෙවන පත්‍රය ලකුණු	120
මුළු ලකුණු	200
සාමාන්‍ය ලකුණු	$\frac{200}{2}$ = 100